# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය
த. பெ.இ
Po.Box No – 10120

ෆැක්ස්
தொலைநகல
Fax – 011-2171635

දුරකථන
தொலைபேசி
Telephone – 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය
இணையதளம்
Web Site – www.Police.lk

ඊ මේල්
மின்னஞ்சல்
E-mail – dir.media@police.gov.lk


මගේ අංකය
எனது இலக்கம்
My NO – 1335 / 2023

ඔබේ අංකය
உமது இலக்கம்
Your No – / 2023

දිනය
திகதி
Date – 23/10/2023
පැය 0520

## මාධ්‍ය නිවේදනය

### 01. හෙරොයින් සමඟ සැකකරුවන් තිදෙනෙකු අත්අඩංගුවට - දිවුලපිටිය පොලිස් ස්ථානය.

2023.10.22 වන දින සවස් කාලයේ දිවුලපිටිය පොලිස් වසමේ දිවුලපිටිය මීරිගම මාර්ගයේ වැවගෙදර හන්දියේදී දිවුලපිටිය පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් ක්ෂණික මාර්ග බාධක රාජකාරියේ යෙදී සිටියදී සැකකටයුතු ත්‍රීරෝද රථයක් නවතා පරීක්ෂා කර ඇත. එහි සිටි **රියදුරු සන්තකයේ හෙරොයින් ග්‍රෑම් 05 මිලිග්‍රෑම් 450 ක් සහ පසුපසු අසුනේ ගමන් කල පුද්ගලයින් දෙදෙනා සන්තකයේ හෙරොයින් ග්‍රෑම් 13 මිලිග්‍රෑම් 500 ක් තිබී අත්අඩංගුවට** ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 24, 28 හා 33 යන වයස් වල පසුවන මරදගහමුල, මීරිගම හා හොරම්පැල්ල යන ප්‍රදේශ වල පදිංචිකරුවන් වේ.**

දිවුලපිටිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකර ගෙන යනු ලබයි.

### 02. නීති විරෝධී මත්පැන් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - මීනුවන්ගොඩ පොලිස් ස්ථානය.

2023.10.22 වන දින දහවල් කාලයේ මීනුවන්ගොඩ පොලිස් වසමේ කොටුගොඩ ප්‍රදේශයේදී මීනුවන්ගොඩ පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **ගෝඩා ලීටර් 1134 ක් (බැරල් 06 ක්) නීති විරෝධී මත්පැන් ලීටර් 75 ක්, නීති විරෝධී මත්පැන් පෙරීම සඳහා උපයෝගී කරගන්නා ලද තඹ දඟර 02 ක්, ගෑස් සිලින්ඩරයක් හා ගෑස් ලිපක් සමඟ සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 23 ක් වූ කොටුගොඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මීනුවන්ගොඩ පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකර ගෙන යනු ලබයි.

### 03. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - දඹගල්ල පොලිස් ස්ථානය.

2023.10.22 වන දින රාත්‍රී කාලයේ දඹගල්ල පොලිස් වසමේ නාගොල්ල ප්‍රදේශයේදී දඹගල්ල පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **මෙරට නිෂ්පාදිත ගිනි අවියක්** සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 17 ක් වූ නාගොල්ල, බඳුවෙල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**
දඹගල්ල පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකර ගෙන යනු ලබයි.

## 04. දියේ ගිලී මියයාමක් - පොතුවිල් පොලිස් වසම.

2023.10.22 වන පොතුවිල් පොලිස් වසමේ කොට්ටුකල්ලු කලපුවේ පුද්ගලයෙකු මියගොස් සිටින බවට පොතුවිල් පොලිස් ස්ථානයට ලද පැමිණිල්ලක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 73 ක්වූ පොතුවිල් ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය පොතුවිල් රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. මරණකරු කලක සිට මානසික රෝගී තත්ත්වයකට ප්‍රතිකාර ලබන පුද්ගලයෙකු බවට දැනට සිදුකරන ලද විමර්ශනයේදී අනාවරණය වී ඇත. පොතුවිල් පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරගෙන යනු ලබයි.

## 05. මාරක රිය අනතුරක් - කටුනායක පොලිස් වසම.

2023.10.22 වන දින රාත්‍රී කාලයේ කටුනායක පොලිස් වසමේ ගුවන්තොටුපල මිනුවන්ගොඩ මාර්ගයේ ආඩිඅම්බලම මධ්‍යම බෙහෙත් ශාලාව අසලදී මිනුවන්ගොඩ දෙස සිට ගුවන්තොටුපල දෙසට ධාවනය වූ ත්‍රීරෝද රථයක් හා ප්‍රතිවිරුද්ධ දෙසින් පැමිණි බස් රථයක් මුහුණට මුහුණ ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ ත්‍රීරෝද රථයේ රියදුරු හා පසු පසු අසුනේ ගමන් කල පුද්ගලයෙකු මීගමුව රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇත.

**මරණකරුවන් අවුරුදු 19 හා 25 වයස් වල පසුවන බෙම්මුල්ල හා මාකෙවිට ප්‍රදේශ වල පදිංචිකරුවන් වේ.**

මෘත ශරීර මීගමුව රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. අනතුර සම්බන්ධයෙන් බස් රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇත. කටුනායක පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 06. මාරක රිය අනතුරක් - වාද්දුව පොලිස් වසම.

2023.10.22 වන දින උදෑසන කාලයේ වාද්දුව පොලිස් වසමේ වාද්දුව නගරයේදී ගාල්ල දෙස සිට කොළඹ දෙසට ධාවනය වූ පුද්ගලික බස් රථයක් එම දෙසටම ධාවනය වූ වෙනත් බස් රථයකට ඉස්සර කරමින් ධාවනය කර ඇත. එම අවස්ථාවේදී කොළඹ දෙසටම මාර්ගයේ දකුණු පසින් ගමන් කල යතුරුපැදියක් බස් රථයේ බඳෙහි ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ යතුරුපැදිකරු පානදුර රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 52 ක් වූ පයාගල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය පානදුර රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. අනතුර සම්බන්ධයෙන් බස් රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇත. වාද්දුව පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 07. මාරක රිය අනතුරක් - දෙහිඅත්තකණ්ඩිය පොලිස් වසම.

2023.10.22 වන දින සවස් කාලයේ දෙහිඅත්තකණ්ඩිය පොලිස් වසමේ දෙහිඅත්තකණ්ඩිය සමනලතැන්න මාර්ගයේ සමනලතැන්න ආරාමය අසලදී කුඩාගලට හැරෙන හන්දිය දෙසට ධාවනය වූ යතුරුපැදියක් පැදිකරුට පාලනය කර ගැනීමට නොහැකිව මාර්ගයෙන් ඉවතට පැන ගසක ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ යතුරුපැදිකරු දෙහිඅත්තකණ්ඩිය රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 56 ක් වූ සමනලතැන්න ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය දෙහිඅත්තකණ්ඩිය රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. දෙහිඅත්තකණ්ඩිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 08. මාරක රිය අනතුරක් - හෙම්මාතගම පොලිස් වසම.

2023.10.22 වන දින සවස් කාලයේ හෙම්මාතගම පොලිස් වසමේ අම්බුළුවාව හෙම්මාතගම මාර්ගයේ වාඩියතැන්න හන්දිය ප්‍රදේශයේදී අම්බුළුවාව දෙස සිට හෙම්මාතගම දෙසට ධාවනය වූ යතුරුපැදියක් මාර්ගය හරහා ගමන් කල කාන්තාවකගේ ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ කාන්තාව සහ යතුරුපැදිකරු හෙම්මාතගම රෝහලට ඇතුලත් කිරීමේදී කාන්තාව මියගොස් ඇත.

**මරණකාරිය වයස අවුරුදු 75 ක් වූ අම්බුළුවාව ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

මෘත ශරීරය හෙම්මාතගම රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. හෙම්මාතගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**